# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2061/10 - 2018 මාර්තු මස 05 වැනි සඳුදා - 2018.03.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### මධ්‍යම පළාතේ පළාත් සභාව

පූජාපිටිය ප්‍රාදේශීය සභාව

**විනෝද බදු පැනවීම**

(267 වන අධිකාරිය වූ) විනෝද බදු ආඥාපනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව පූජාපිටිය ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් තීරණය කරන ලද පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ (2) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර මධ්‍යම පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද බව එකී උපවගන්තිය අනුව මෙයින් පළකරනු ලැබේ.


ආර්. එම්. පී. එස්. රත්නායක,<br>
ලේකම්,<br>
ප්‍රධාන, අධ්‍යාපන හා පළාත් පාලන අමාත්‍යාංශය,<br>
මධ්‍යම පළාත.


2017 ඔක්තෝබර් මස 12 වැනි දින,<br>
පල්ලේකැලේ දී ය.

*යෝජනාව*

1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2(1) වගන්තියෙන් හා 1984 අංක 37 දරන විනෝද බදු සංශෝධිත පනත අනුව පූජාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ විනෝද බදු අය කිරීම සඳහා ප්‍රවේශ පත්‍ර ගාස්තුවෙන් (විනෝද බදු හැර) 10%ක විනෝද බද්දක් අයකිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව තීරණය කරන්නීය.

03 -779


1A PG 3938 — 32 (2018/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*